ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2018 ජූලි 16 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2018 ජුනි

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2018 මැයි මස වාර්තා කළ 60.6 ක අගයට සාපේක්ෂව 2018 ජුනි මාසයේ දී 57.6 ක දර්ශක අගයක් දක්වා අඩු වූ අතර මෙය පසුගිය වසරවල පැවති ප්‍රවණතාවයට ද අනුකූල විය. මේ සඳහා, විශේෂයෙන්ම නිෂ්පාදනයෙහි දක්නට ලැබූ සැළකිය යුතු පහළ යෑම හේතු වූ අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් ආහාරපාන සහ දුම්කොළ නිෂ්පාදන අංශයෙහි දක්නට ලැබුණු පහළ යෑම බලපාන ලදී. මේ අතර, නව ඇණවුම් සහ ගැනුම් තොග ද ජුනි මාසය තුළ පහළ යන ලදී. කෙසේ වුවද, රෙදිපිළි සහ නිමි ඇඳුම් අංශයෙහි නව බඳවා ගැනීම් සමස්ත සේවා නියුක්තිය ඉහළ යෑමට හේතු විය. මේ අතර, මෙම මාසය තුල පැවති අයහපත් කාළගුණික තත්ත්ව සහ චීනයේ පාරිසරික නීති රීති දැඩි වීම හේතුවෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ඉහළ යන ලදී. සමස්තයක් ලෙස, ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කල අතර, එමගින් 2018 ජුනි මාසයේ දී නිෂ්පාදන ක්‍රියාකාරකම්, 2018 මැයි මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය වූ බව පෙන්නුම් කෙරෙයි. මේ අතර, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් යහපත් බව පෙන්නුම් කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සිදු වූ ඉහළ වර්ධනයෙහි දායකත්වයෙන් 2018 මැයි මාසයේ දී වාර්තා වූ 56.9 ක දර්ශක අගයට සාපේක්ෂව 2018 ජුනි මාසයේ දී 58.7 ක දර්ශක අගයක් දක්වා ඉහළ යන ලදී. ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, සෞඛ්‍ය සේවා සහ තොග සහ සිල්ලර වෙළඳාම යන අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම්වල ඉහළ වර්ධනයක් දක්නට හැකි විය. ප්‍රතිචාර දක්වන්නන් මෙම වර්ධනයට හේතු ලෙස මූල්‍ය සේවා සැපයුම් මාර්ග වැඩිදියුණු වීම සහ රාමසාන් උත්සවය හේතුවෙන් ඉල්ලුම ඉහළ යෑම සඳහන් කර තිබුණි. කෙසේ වුවද, ඉන්ධන මිල ඉහළ යෑම හේතුවෙන් 2018 ජුනි මාසයේ දී ප්‍රවාහන අංශයෙහි වර්ධනය මන්දගාමී විය. ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සිදු වූ වර්ධනය සේවා නියුක්තියෙහි 2015 දෙසැම්බර් මස සිට සිදු වූ ඉහළම වර්ධනය සඳහා දායකත්වයක් ලබාදුන් අතර මෙය නිම කිරීමට ඇති කාර්යයන්වල පහළ යෑමට ද යම්තාක් දුරකට හේතු විය. මේ අතර, ඉදිරි මාස 3 සඳහා සේවා සපයන්නන්ගේ ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ සුබවාදී අපේක්ෂා වැඩි වේගයකින් වර්ධනය වූ අතර ඉදිරියේ දී එළඹෙන සංචාරක සමය හේතුවෙන් නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවාවන්හි මෙය ප්‍රධාන වශයෙන් දක්නට ලැබුණි. ඉන්ධන මිල ඉහළ යෑම සහ ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් සේවා අංශයේ අයකරන මිල ගණන් ඉහළ යන ලදී. 2018 වසරේ දී සිදු විය හැකි වැටුප් වර්ධන හේතුවෙන් සේවා අංශයේ අපේක්ෂිත ශ්‍රම පිරිවැය ද ඉහළ ගියේය.

| ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | | | | | | | | | | | | |
| **2015** | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| **2017** | 56.2 | 57.1 | 66.5 | 41.8 | 57.9 | 56.1 | 54.3 | 54.4 | 59.0 | 54.8 | 58.8 | 59.1 |
| **2018** | 51.7 | 55.6 | 65.6 | 45.5 | 60.6 | **57.6** | - | - | - | - | - | - |
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | | | | | | | | | | | | |
| **2015** | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| **2017** | 57.5 | 57.3 | 60.8 | 54.2 | 55.3 | 59.2 | 59.1 | 60.1 | 57.0 | 55.3 | 57.4 | 61.2 |
| **2018** | 56.6 | 58.4 | 58.0 | 53.2 | 56.9 | **58.7** | - | - | - | - | - | - |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.